www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප එක්සත් සමාජවාදී පක්ෂයට පිලිතුරු දෙයි

## Sri Lankan SEP replies to the United Socialist Party

විජේ ඩයස් විසිනි

2010 පෙබරවාරි 04

එක්සත් සමාජවාදී පක්ෂයේ (එසප) හිටපු වම්මු. දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) සමඟ ගෙනගිය අවස්ථාවාදී උපාමාරු, සමාජවාදී සමානතා පක්ෂය (සසප) විසින් හෙලිදරව් කිරීමෙන් තිගැස්මට පත්ව, තම පූච්චානම් දේශපාලනය ආරක්ෂාකර ගැනීමට වෑයම් කරමින් ඒගැන ලිවීමට තදියමක් දක්වා තිබේ. (''වික්‍රමාන්විත එක්සත් සමාජවාදී පක්ෂයට එරෙහි මඬගැසීමට පිලිතුර'') (''එක්සත් සමාජවාදී පක්ෂයේ දෙමුහුනුවර'' යන ලිපිය කියවන්න'')

ඔවුන් එජාප සමඟ හවුලේ ගොඩනඟාගත් ''නිදහසේ වේදිකාව'' විවෘතව ආරක්ෂා කිරීමක් වූ එසප පිලිතුර, කම්කරු පන්තියට වැදගත් ප්‍රශ්න මතුකර තිබේ. මෙම ''එක්සත් පෙරමුන'' අටවාගැනීමට ඔවුන් ගත් ''වික්‍රමාන්විත'' පියවර ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමක් බව එසප මහත් උජාරුවෙන් කියා සිටියි. එසප පන්ති සහයෝගිතා සන්ධානය, සාවද්‍ය ලෙස එජාප නායකත්වය ''ප්‍රජාතන්ත්‍රවාදීන්'' බව හුවා දැක්වනවා පමනක් නොව, කම්කරුවන් මේ ප්‍රයෝගයෙන් රවටන තාක් දුරට ඔවුන්, තමන්ගේම ස්වාධීන මැදිහත්වීමකින් තම අයිතීන් රැකගැනීමෙහිලා කම්කරුවන් සතු හැකියාවට ද වලකපා තිබේ. ජනාධිපතිවරනයෙන් ඉක්බිත්තේ ජනාධිපති මහින්ද රාජපක්ෂ, ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ලකරන සිය ප්‍රහාරය උත්සන්න කර තිබියදී, වැඩකරන ජනතාව නියමිත දේශපාලන පාඩම් උකහා ගැනීම අවශ්‍යය.

වඩාත් මූලික කරුනු වලට යොමුවීමට පෙර, එසපයේ පිලිතුර පදනම් කල විකෘති කිරීම් සමඟ ගනුදෙනු බේරාගැනීම අවශ්‍ය කෙරේ. ''සිය ජනාධිපති අපේක්ෂක සිරිතුංග ජයසූරිය'' එජාප ජනාධිපති අපේක්ෂක ''සරත් ෆොන්සේකා වෙනුවෙන් කඩේ යන බවට අවලාද සහගතව චෝදනා නඟන'' සසපයේ ''දූෂ්‍ය ලිපිය'' ලේඛකයාගේ හෙලාදැකීමට ලක්වෙයි. කිසිවක් උපුටා දක්වා ඇත්තේ නැත. ඔවුන්ට එසේ කල හකි ද නොවේ. සසප ලිපිය තුල මේ ක්‍රියාවලිය නිශ්චිතව පැහැදිලි කෙරේ. එසප ඍජුවම ෆොන්සේකාට සහයෝගය නොදුන්නේවී නමුත්, 2009 ජනවාරි මාසයේදී ''නිදහසේ වේදිකාව'' මත එජාප සමඟ එකට පෙනීසිටීම මඟින් ඔවුන්, මෙම අපකීර්තිමත් ධනේශ්වර පක්ෂයට ප්‍රජාතන්ත්‍රවාදයේ සලුපිලි ඇන්දවීමට සහායවී තිබේ. අනෙක් අතට, පසුගිය මාසයේ ජනාධිපතිවරනයේදී එජාප සිය ජනාධිපති අපේක්ෂකයා ලෙස ජෙනරාල් ෆොන්සේකාට පිටුබලය සැපයීමේදී, එජාපයට එය බෙහෙවින් ප්‍රයෝජනවත් විය.

නිදහසේ වේදිකාව ගොඩනංවන අවධියේදී, ''ෆොන්සේකා නමැති සාධකය පැවතුනේ නැතැයි'' කියා සිටිමින් එසප ලේඛකයා ප්‍රශ්නය මඟහැර යයි. 2009 ජනවාරියේදී ෆොන්සේකා අපේක්ෂකයෙක් නොවූ බව නිසැකයෙන්ම සැබෑවකි. ඔහු එවකට රටේ ඉහලම ජෙනරාල් ලෙස කටයුතු කරමින් මිලිටරියේ යුද අපරාධ හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරීමේදී රාජපක්ෂ සමඟ එකට වගකීම දැරීය. සත්‍ය වශයෙන්ම, වේදිකාව ගොඩනැඟීමේදී සන්ඩේ ලීඩර් කතෘ ලසන්ත වික්‍රමතුංගගේ කුරිරු ඝාතනය මූලික කාරනයක් වූවා සේම, එය සිදුකරනු ලැබුවේ මිලිටරිය සමඟ අත්වැල් බැඳගත් ආන්ඩු ගැති ඝාතක කල්ලියක් විසින්ය යන්න ද එසේම නිශ්චිතය.

කෙසේ වුවත් වසරකට පසුව ෆොන්සේකා රාජපක්ෂ සමඟ විරසක වූ අතර, හමුදා තනතුරෙන් ඉල්ලා අස්වී එජාප හා සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ''පොදු අපේක්ෂකයා'' ලෙස පෙනී සිටියේය. එජාප ජෙනරාල් වැලඳගෙන තිබියදීම, වේදිකාවේ සංවත්සරය සැමරීම සඳහා එජාප නායක රනිල් වික්‍රමසිංහ සමඟ කරේ අත දමාගැනීමේදී එසප ජයසූරියට කිසිදු දෙගිඩියාවක් නොවීය. ජයසූරිය, ෆොන්සේකාට සහායදීම පිලිබඳව එජාප හෙලා දැකීමට එය අවස්ථාවක් කොටගත්තේ නැත. ඒ වෙනුවට, වේදිකාවේ ''සාර්ථකත්වය'' පිලිබඳව එකිනෙකාගේ පිටට තට්ටුකර ගැනීමට එය අවස්ථාව කරගත් අතර, ජනාධිපතිවරනයෙන් කවුරු ජයගත්තත් එය ඉදියට ගෙනයාමට පොරොන්දු දුන්නේය.

එසප පිලිතුරේ වැඩි කොටසක් මිඩංගු කර තිබුනේ, පක්ෂයේ හා එහි නායකයාගේ ''වික්‍රමාන්විත'' ජයග්‍රහන හුවා දැක්වීමටයි. කෙසේ වෙතත් වීරත්වය, දේශපාලන උපමානයක් නොවේ. නිදසුනක් ලෙස ෆැසිස්ට්වාදීන්, සිය ප්‍රතිගාමී අරමුනු වෙනුවෙන් සටන් කිරීමේදී ඉමහත් කායික ධෛර්යයක් ප්‍රදර්ශනය කල හැකිය. මේ සිද්ධියේදී මෙන්ම, තම දේශපාලනයේදී නොවෙනස්ව ප්‍රකට කරන ආකාරයට, තමන් පුම්බා ගැනීම සඳහා සිය දිරිය බලය ගැන පාරම්බාන සුලු ධනපති දේශපාලඥයන් ගැන පොදුවේ කම්කරුවන් විමසිලිමත් විය යුතුය.

## එක්සත් පෙරමුන

වීරයන් රොත්තකගේ ලැයිස්තුව මධ්‍යයේ එසප, සිය ''නිදහස සඳහා වේදිකාව දේශපාලන සන්ධානයක් නොව, දැවැන්ත මර්දනයකට එරෙහි විශාල හඬක වේදිකාවක් බව අවධාරනය කරයි. එසප සාමාජිකයන් නිහඬව සිටීම ප්‍රතික්ෂේප කරන අතර, දේශපාලන කන්ඩායමක් තුල නොව, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමට කැපවූ නිශ්චිත ප්‍රායෝගික උද්ඝෝෂනයකට හවුල් වීමට සූදානම්ව සිටිති. කිසිදු බලවේගයක්, ධනේශ්වර ආකෘතියට පිටින් යාම ප්‍රතික්ෂේප කරන බලවේග පවා, නොතකා නොහැරීම නිවැරදිය.''

ජයසූරිය හා ඔහුගේ දක්ෂිනාංශික සගයන් විසින් ''ප්‍රජාතන්ත්‍රවාදය'' පිලිබඳව උත්පාදනය කල සාමූහික පුහු ඝෝෂාව හැරෙන්නට, වේදිකාවෙන් ගෙනගියේ කුමන ප්‍රායෝගික උද්ඝෝෂනයක් දැයි ඇසීමට යමෙකුට සම්පූර්න අයිතිය තිබේ. ආන්ඩුවට එරෙහිව දේශපාලන වර්ජනයක කොටසක් ලෙස, ආන්ඩු ගැති ඝාතක කල්ලිවල කටයුතු වලට එරෙහි වීමටත්, කම්කරුවන්ගේ හා ඔවුන්ගේ සංවිධාන ආරක්ෂාකර ගැනීමටත්, කම්කරු පන්තියේ කිසිදු කොටසක් බලමුලු ගැන්වූයේ නැත. ප්‍රසිද්ධ ධනේශ්වර පක්ෂයක් වන එජාප, කම්කරු පන්තිය විසින් ධනේශ්වර පාලනයට තර්ජනය කරනු ලැබිය හැකි කිසිදු ක්‍රියාවකට ඓන්ද්‍රීයවම සතුරු වන තත්වයක් තුල, එවැන්නක් සිදුවිය හැක්කේ ද නොවේ.

ප්‍රතික්ෂෙප කිරීම් තිබියදීම ''නිදහස සඳහා වේදිකාවේ ප්‍රඥප්තිය,'' හවුල්කරුවන් කිසිවෙකුත්, කිසිදු ප්‍රායෝගික කටයුත්තක් සඳහා මෙහෙයවීමට සූදානම් නොවුනු දේශපාලන කන්ඩායමක් ගොඩනැගීම සඳහා එසප, එජාප සමඟ ගාල්වූ බව සක්සුදක් සේ පැහැදිලි කරයි. ''දිවයිනේ සතරදිග් භාගයේම ද පලාත් නවයේම ද සියලු ජාතීන්ට හා ආගම් වලට අයත් ජනතාව අතර ජීවත්වීමේ අයිතිය හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය'' ආරක්ෂා කිරීම පිලිබඳව ඇති තරම් ප්‍රලාප සහගතව කථා කරන මෙම කෙටි ලියවිල්ල, ප්‍රායෝගික පියවර ගැන නම් වචනයක්වත් සඳහන් කරන්නේ නැත.

සිය පිලිතුර තුල එසප, මෙම දේශපාලන ප්‍රොඩාවේ නියමුවන් ලෙස ලෙනින්ගේ හා ට්‍රොට්ස්කිගේ නම් ද පටලවයි. ලේඛකයා අවමානයෙන් යුතුව පවසන්නේ, ''ලෝසවෙඅ උගත් මහාචාර්යවරුන්ට'' අවශ්‍ය නම් උද්‍රතයන් පවා සැපයිය හැකි බවයි. අවශ්‍ය නැත. මාක්ස්වාදී ව්‍යාපාරයේ දිගු ඉතිහාසය තුල, එක්සත් පෙරමුනු උපාය අතර වෙනස්කම් පිලිබඳව ද එසප සිය සම්පූර්න දේශපාලන මාවතේ, දිගටම අනුගමනය කල, කම්කරු පන්තියට නිරතුරුවම ව්‍යසනයක් බව සනාථවී තිබෙන අවස්ථාවාදී සන්ධානයේ ස්වභාවය පිලිබඳව ද  සසපට හොඳ අවබෝධයක් තිබේ.

එක්සත් පෙරමුනේ සාරය වන්නේ, පන්ති අරගලයේ ක්‍රමෝපායන් යොදාගනිමින් කම්කරු පන්තිය, පන්ති සතුරාට එරෙහිව සිය අයිතීන් ආරක්ෂාකර ගැනීම සඳහා එක්සත් කර බලමුලු ගැන්වීමයි. මේ ක්‍රියාවලිය තුලදී මාක්ස්වාදීන්, අවස්ථාවාදී කම්කරු පන්ති නායකයන්ගේ චපලකම් හා දෙපිටකාට්ටුකම් නිරාවරනය කිරීමට සෑම අවස්ථාවක්ම උපයෝගී කර ගනියි. එක්සත් පෙරමුනක් ගොඩනැංවීම සඳහා දියකල නොහැකි කොන්දේසිය වන්නේ, විප්ලවවාදී පක්ෂයේ දේශපාලන ස්වාධීනත්වයයි. හවුල් දේශපාලන ක්‍රියාමාර්ග එපා, සටන්පාඨ හා ධජ පතාක පටලවා නොගනු.

නාසීන්ට විරුද්ධව 1930 ගනන් වලදී ජර්මානු කොමියුනිස්ට් පක්ෂයේ හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල එක්සත් පෙරමුනක් සඳහා සිය ව්‍යාපාරය ගෙනයද්දී ලියොන් ට්‍රොට්ස්කි මනාව පැහැදිලි කල පරිදි, ''සමාජ ප්‍රජාතන්ත්‍රවාය හෝ ජර්මානු වෘත්තීය සමිති නායකයන් සමග පොදු වේදිකාවක් ඇත්තේ නැත, පෙදු ප්‍රකාශන, සටන් පුවරු, ධජ පතාක ඇත්තේ නැත! පහර දෙන්නේ කෙසේ ද, කා හට පහර දෙන්නේ ද, හා කවදා පහර දෙන්නේ ද යන දේ ගැන පමනක් එකඟ වනු! එවන් එකඟත්වයක් යක්ෂයා සමඟ, ඔහුගේ මිත්තනිය සමඟ හා නොස්කේ හා ග්‍රෙන්සින්කි සමඟ හෝ ඇතිකර ගත හැකිය. එහෙත් එක් කොන්දේසියක් යටතේය, එනම්, එකිනෙකාගේ අත් පටලවා නොගෙනය.''

1980 ගනන්වල, එවකට එජාප ආන්ඩුව බලයේ සිටියදී සසප පූර්වගාමී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස) සටන් වැදුනේ හරියටම ඒ සඳහාය. 1983 එල්ටීටීඊයට එරෙහිව යුද්ධය දියත් කල එජාප, දකුනේ වැඩෙමින් තිබුනු නොසංසුන්තාව මැඩීම සඳහා ආරක්ෂක හමුදා නිදහස්කර ගැනීමේ අරමුනෙන්, උතුරට ඊනියා ඉන්දීය සාම හමුදා කැඳවීමට ඉඩ සැලසූ, ඉන්දු ලංකා ගිවිසුමට අත්සන් තැබීය. ප්‍රතිගාමී, සිංහල ස්වෝත්තමවාදී දෘෂ්ඨි ආස්ථානයක සිට ගිවිසුමට විරෝධය පල කල ජවිපෙ මර්ධනය කිරීමේ කඩතුරාව යටතේ ආන්ඩුව, යුද නීතිය ක්‍රියාත්මක කලේය. සිය ගනනක් කම්කරුවන්, වෘත්තීය සමිති සාමාජිකයන් හා

දේශපාලන ක්‍රියාකාරීන් ෆැසිස්ට් ජවිපෙ මැරයන් මෙන්ම හමුදාව විසින් ද මරාදමනු ලැබිනි.

කෙලවරදී එජාප ආන්ඩුවට එරෙහි මහා වැඩවර්ජනයක් ද ඇතුලු කම්කරු ආරක්ෂක හට කන්ඩායම්, ඒකාබද්ධ පිකට් වැට හා පෙලපාලි සංවිධානය කිරීමේ ප්‍රායෝගික පියවර ගැනීම සඳහා එක්සත් පෙරමුනක් යෝජනා කරමින් විකොස, ලංකා සමසමාජ පක්ෂය (ලසසප), ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය (කොප), ලංකා කම්කරු කොංග්‍රසය හා ජයසූරිය එවකට නායකයෙකුව සිටි නව සමසමාජ පක්ෂය (නසසප) වෙත ලියා දැන්වීය.

නසසප, ''නිර්ධන පන්තික නව ප්‍රතිසංස්කරනවාදී මහජන ප්‍රවනතාව'' ලෙස හැඳින්වූ ශ්‍රී ලංකා මහජන පක්ෂය (ශ්‍රීලමප) බැහැර කිරීම නිසා, විකොස ''කට්ටිවාදී'' යයි චෝදනා කරමින් යෝජනාව එක එල්ලේ ප්‍රතික්ෂේප කලේය. එවකට විකොස පැහැදිලි කල පරිදි මහජන පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක්ව සිටි ධනේශ්වර පක්ෂයකි. (විජය කුමාරතුංග ඝාතනයෙන් පසුව) එහි නායිකාව බවට පත්වූ චන්ද්‍රිකා කුමාරතුංග පසුව රටේ ජනාධිපති වරිය බවට පත් වූවාය. ශ්‍රීලනිප වත්මන් නායක අන් කවරෙකු වත් නොව ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවේදයන් පිලබඳව නම්දරා සිටින වර්තමාන ජනාධිපති රාජපක්ෂය.

මතභේද ඊටත් වඩා පැහැදිලි විය නොහැකිය. එක්සත් පෙරමුනක් සඳහා විකොස කැඳවුමට එරෙහිව නසසප දඩබ්බර ලෙස ආරක්ෂා කලේ, ලෙනින් හා ට්‍රොට්ස්කි විසින් විප්ලවවාදී මාක්ස්වාදී පක්ෂයක් සඳහා සමාව දිය නොහැකි වරදකැයි නිතර අවධාරනය කල වර්ගයේ දේශපාලන සන්ධානයකි. විකොස පෙන්වා දුන් පරිදි නසසප විසින් අටවාගෙන තිබූනේ, ''ඉදිරිදර්ශන හා ඉදිරිමාවත'' යන අන්ඩුවක් සඳහාවූ පොදු ක්‍රියාමාර්ගයක පදනම මත, ධනේශ්වර ශ්‍රීලමප සමඟ මැතිවරන සන්ධානයකි. ස්ටැලින්වාදීන් විසින් තොරොම්බල් කල මේ වර්ගයේ මහජන පෙරමුනු සන්ධානය, 1930 ගනන් වලදී ප්‍රංශ හා ස්පාඤ්ඤ කම්කරු පන්තීන් මෙහෙයවනු ලැබුවේ ව්‍යසනයන් කරාය. 1980 ගනන් වල මෙරට කම්කරුවන්ට අත්විඳින්නට සිදුවූ ප්‍රතිවිපාක ඊට නොදෙවෙනි විය. එමඟින්, කම්කරු පන්තියට තමන්ගේම ස්වාධීන දේශපාලන බලමුලු ගැන්වීම අවශ්‍යවම තිබුන මෙහොතේදී එය පක්ෂඝාත කලේය.

ජවිපෙ ආන්ඩුවට ගැනීම පිලිබඳ අදහස සමඟ ආලිංගනයේ යෙදීමෙන් අනතුරුව එජාප ජනාධිපති රනසිංහ ප්‍රේමදාස, 1989 න් පසුව ජවිපෙට හා ග්‍රාමීය සිංහල තරුනයන්ට එරෙහිව දකුනේදී ආරක්ෂක හමුදා මුදා හැරියේය. ගනන් බලා ඇති පරිදි 60000 ක් තරුනයන් මිලිටරිය, එහි ඝාතක කල්ලි හා එහි රහසිගත වධකාගාර හා සිරමැදිරි ජාලය උපයෝගී කරගෙන මරා දැමුනි. වේදිකාව මත ජයසූරිය විසින් වැලඳගෙන තිබෙන හා ප්‍රජාතන්ත්‍රවාදයේ පතාක යෝධයෙකු ලෙස හුවා දක්වන එජාප වත්මන් නායක රනිල් වික්‍රමසිංහ, එවක ආන්ඩුවේ ඇමතිවරයෙකුව සිටි අතර ආන්ඩුවේ අපරාධ පිලිබඳව ඍජුවම දේශපාලන වගකීම දරන්නෙකි.

**ඉතිහාසය පිලිබඳව**

කෙසේ වෙතත්, එසප සියලු ඓතිහාසික ප්‍රශ්න පිලිබඳව දක්වන්නේ සාවඥ ආකල්පයකි. එය මෙසේ කියයි. ''ශ්‍රී ලංකාව පිලිබඳව පලකෙරෙන ඔවුන්ගේ සියලු ලිපිවලම පාහේ ලෝසවෙඅ නිශ්චිත ඓතිහාසික සිදුවීම් මත අවදානය යොදමින්, සියල්ලටම වරද පටවන්නේ ලංකා සමසමාජ පක්ෂයේ පාවාදීම මතය. ආඩම්බර වීමට කිසිවක් නොමැති හීලිවාදී සම්ප්‍රදායන් ගැන ඔවුන්ට කීමට ඇත්තේ සුලු දෙයකි. මැත සිදුවීම් පවා විස්තර කරන්නේ ලසසප පාවාදීමේ කොටසක් ලෙසය. ඉතිහාසය ඊට වඩා බෙහෙවින් සංකීර්නය. මාක්ස්වාදීන්ට නම්, ඓතිහාසික අසාර්ථකත්වයන් වටහා ගැනීම වැදගත් වන නමුත්, අප ජීවත්වන අවධිය සැලකිල්ලට ගැනීම ද වැදගත්ය. එසේම, ඉතිහාසයේ එක් සිදුවීමක් මත සියල්ලෙහි වරද පැටවීමට වඩා, අවධිය අවබෝධකර ගැනීම සඳහා මාක්ස්වාදී විධික්‍රමයන් යොදාගැනීම වැදගත් වේ.''

වැඩිපුර දෙයක් දැනගැනීමට අවශ්‍ය කෙනෙක් අතරමඟ ය. කිසිවක් පැහැදිලි කෙරෙන්නේ නැත. ඓතිහාසික ප්‍රශ්න පිලිබඳව දක්වන මේ නිසරු ආකල්පය සුලු ධනපති සංවිධානවල කැපී පෙනෙන ලක්ෂනයයකි. ජයසූරිය විශේෂයෙන්ම තම සංවිධානයේ ඉතිහාසය සිහිපත් කිරීමට කැමැත්තක් නොදක්වයි. එහි වාර්තාව වනාහි කම්කරු පන්තියට නොමඳව ගෙවීමට සිදුවූ, අමිහිරි උපාමාරු දැමීමක් මෙන්ම දේශපාලන ව්‍යසනයකි. කෙසේ වෙතත් කම්තරු පන්තියට පෙරට යා හැක්කේ, ලංකාව තුල මෙන්ම ජාත්‍යන්තරව ද තෙමේ ලත් මූලෝපායික අත්දැකීම් වලින් අවශ්‍ය පාඩම් උකහා ගන්නා තාක් දුරට පමනි. ඉතිහාසය පැහැදිලි කර ඇත්තේ, එසපට මාක්ස්වාදය සමඟ හෝ මූලධර්මාත්මක විප්ලවවාදී දේශපාලනය සමඟ හෝ මොනම සම්බන්ධයක්වත් නොමැති බවයි.

පුලුල්ව පැතිර තිබූ කම්කරු පන්තික විරෝධය මධ්‍යයේ, 1964 දී සිරිමා බන්ඩාරනායක මහත්මියගේ ධනපති ආන්ඩුවට ඇතුලු වෙමින් ලසසප කල පාවාදීමෙහි, ලංකාවේ මෙන්ම ජාත්‍යන්තර කම්කරු පන්තිය කෙරෙහි ද ප්‍රගාඪ ඇඟවුම් ගැබ්කර ගත්තේය. ප්‍රකට ට්‍රොට්ස්කිවාදී පක්ෂයක් සමාජවාදී ජාත්‍යන්තරවාදයේ මූලධර්ම විවෘතවම අතහැර දැමූ ප්‍රථම අවස්ථාව එයයි. එහි ප්‍රතිඵල වශයෙන් පන්ති එකමුතුව සඳහා අරගලයක් නොවූ අතර, ජවිපෙ හා එල්ටීටීඊ සුලු ධනපති

ගරිල්ලාවාදය ද ඇතුලු වාර්ගික දේශපාලනය ප්‍රචලිත විය. ලසසප පාවාදීම පසුකාලීන සමස්ත ඉතිහාසයම තීරනය නොකලා වුවත්, සිවිල් යුද්ධය පැනනැඟීම ද ඇතුලු පසුකාලීන වර්ධනයන් ග්‍රහනය කර ගැනීම, එහි ප්‍රතිවිපාක වටහා ගැනීමෙන් තොරව කල නොහැකිය.

1964 දී හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ බ්‍රිතාන්‍ය ශාඛාවේ නායකයාවූ ජෙරී හීලි කොලඹට පැමින බන්ඩාරනායක ආන්ඩුවට ඇතුල් වීම සඳහා අනුමැතිය පලකල ලසසප සමුලුවෙන් පිටත සිටිමින් ඊට එරෙහිව උද්ඝෝෂනයක නිරත විය. මෙම පාවාදීමේ මූලයන් පැවතියේ, 1950 ගනන් වල මුල, මයිකල් පැබ්ලෝ හා අර්නස්ට් මැන්ඩෙල් විසින් නායකත්වය දුන්, හතරවන ජාත්‍යන්තරය තුල හිස එසවූ අවස්ථාවාදී ප්‍රවනතාව තුල බව හීලි හඳුනා ගත්තේය. පැබ්ලෝවාදීන් අනුගත වූයේ, ධනවාදයේ පශ්චාත් යුදකාලීන ප්‍රති ස්ථාවරත්වයට හා ප්‍රමුඛ ස්ටැලින්වාදී, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා ධනේශ්වර ජාතිකවාදී නායකත්වයන්ට ය. සසප ලංකා ශාඛාව ලෙස සම්බන්ධව සිටින ජාත්‍යන්තර කමිටුව 1953 දී ගොඩනඟනු ලැබුවේ, ට්‍රොට්ස්කිවාදී මූලධර්ම ආරක්ෂා කරමින් පැබ්ලෝවාදී අවස්ථාවාදයට එරෙහිව සටන් වැදීමටය. එසප වර්තමානයේ සන්ධානගතව සිටින ''අවස්ථාවාදී'' ජාත්‍යන්තරය වන කම්කරු ජාත්‍යන්තරයේ කමිටුවෙහි මුල්, පැබ්ලෝ හා මැන්ඩෙල්ගේ දෘෂ්ටීන්ට අනුකූලවූ හා පැබ්ලෝවාදී ජාත්‍යන්තරයේ බ්‍රිතාන්‍ය ශාඛාව වෙනුවෙන් ඡන්ද අයිතිය හිමිකරගෙන සිටි ටෙඩ් ග්‍රාන්ට් දක්වා දිවයයි.

*ලංකාව-මහා පාවාදීම* නමැති සිය පොත් පිංච තුල හීලි මෙසේ පැහැදිලි කලේය. ''(ලසසපයේ) පරිහානිය, ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ඇතුලත කෙරුනු අරගලය සමඟ නොබිඳිය හැකි ආකාරයෙන් බැඳී තිබේ. එය, පැබ්ලෝ හා ඔහුගේ යුරෝපීය සගයන් වන ජර්මේන් (මැන්ඩෙල්) හා පියෙරි ෆ්‍රැන්ක් විසින් කල පාවාදීමේ පරිපූර්න නිදසුන නියෝජනය කලේය.'' ඔහු මෙසේ අවධාරනය කලේය. ''පිලිතුර රැඳී ඇත්තේ ලංකාව තුල නොව පැබ්ලෝවාදී සංශෝධනවාදයට එරෙහි අරගලයේ ජාත්‍යන්තර අධ්‍යයනයක් තුලය. සභාගයේ සැබෑ නිර්මාතෘන් වාසය කරන්නේ පැරිසියේය.'' ලසසපයේ පස්සට ගැටීම සඳහා වසර ගනනාවක් තිස්සේ ආධාර හා අනුබල දෙනු ලැබූ පැබ්ලෝවාදීයෝ, කොලඹ සභාග ආන්ඩුව සඳහා මංපෙත් සැකසූහ.

1968 පිහිටුවනු ලැබූ විකොස, මෙම පාඩම් මත තිරසරව පිහිටාගත් අතර, හීලිගේ එම උරුමය සාඩම්බරයෙන් ආරක්ෂා කලේය. ජාත්‍යන්තර කමිටුව සමඟ එක්ව විකොසට, සමාජවාදී කම්කරු පක්ෂයේ උරුමක්කරුවා වූ බ්‍රිතාන්‍ය කම්කරු විප්ලවවාදී පක්ෂය සමඟ 1985-86 දී භේදයෙන් කුලුගැන්වුනු හීලිගේ පසුකාලීන දේශපාලන පරිහානියට එරෙහිව, දේශපාලන අරගලයක් ගෙනයාමට හැකිවූයේ මෙම පදනම් මත පමනි. කම්කරු විප්ලවවාදී පක්ෂයේ පාවාදීම් පිලිබඳ සවිස්තරාත්මක විමර්ෂනයක යෙදෙමින් අවශ්‍ය පාඩම් ජාත්‍යන්තර කමිටුව විසින් උකහාගත් අතරම, විශේෂයෙන්ම 1960 ගනන්වල ට්‍රොට්ස්කිවාදී මූලධර්ම ආරක්ෂා කිරීම ද ඇතුලුව හීලි ඉටුකල දැවැන්ත දේශපාලනික භූමිකාව ද එය හඳුනා ගත්තේය.

ලසසපයේ පාවාදීම අමතක කර දැමීමට එසප කැමැත්තක් දැක්වීම මවිතයට කාරනයක් නොවේ. නසසප නායක වික්‍රමබාහු කරුනාරත්න ද සමඟ ජයසූරිය, පාවාදීමෙන් පසුව ද දශකයකට වැඩි කාලයක් ලසසප තුල රැඳී සිටියහ. බන්ඩාරනායක ආන්ඩුව 1965 දී බිඳ වැටුනු නමුත් ප්‍රධාන ඇමතිකම් කිහිපයක් හිමිකරගත් ලසසප ද සමඟ 1970 දී යලි බලයට පත්විය. සභාග ආන්ඩුව, ගනන් බලා ඇති පරිදි තරුනයන් 15000 ක් ඝාතනය කරමින් 1971 ජවිපෙ කැරැල්ල මැඩ පවත්වද්දී ද බුද්ධාගම රාජ්‍ය ආගම බවට පත්කරමින් වාර්ගික ව්‍යවස්ථාවක් අටවද්දී ද අධ්‍යාපනය තුල දෙමල තරුනයන්ට එරෙහිව වෙනස්කම් කිරීමේ පියවර ගනිද්දී හා දෙමල වතු කම්කරුවන් බලහත්කාරයෙන් ඉන්දියාවට පිටමං කිරීම කඩිනම් කරන අතර තුර ද වික්‍රමබාහු හා ජයසූරිය ලසසපය තුල රැඳී සිටියහ. සැබෑ අවස්ථාවාදීන් ලෙස ඔවුහු පක්ෂයෙන් ඉවත් වූයේ, ලසසප කම්කරුවන් හමුවේ වෛරයට පාත්‍රවෙමින් 1977 මහා මැතිවරනයෙන් අතුගෑවී ගියාටත් පසුවය.

ජයසූරිය හා කරුනාරත්න 1978දී නසසප පිහිටුවාගත් අතර, පසුකාලයකදී තම තමන්ගේ කන්ඩායම් සමඟ දෙපැත්තකට බෙදී ගියේය. එහෙත් ඔවුහු, පන්ති සහයෝගිතාව මත පදනම් කල සභාගවාදී දේශපාලනයෙන් නම් කිසිවිටෙක බිඳුනේ නැත. ''ඉතිහාසය පිලිබඳ එක සඳහනක්'' එනම් 1964 ලසසප පාවාදීම, කෙරෙන් පමනක් නසසප හා ඉන් කැඩී ගිය එසප විසින් ගසන ලද සියලු කරනම් හා යෙදූ උප්පරවැට්ටි පෙරදැකීමට සැබවින්ම පුලුවන් වූයේ නැත. එහෙත් ඔවුන්ගේ සියලු උපාමාරුවල පන්ති ස්වභාවය, 1964 දී ලසසප ගත් ආස්ථානය, එනම්, කම්කරු පන්තිය එක් හෝ තවත් ධනපති නොටසකට යටත් කිරීම හා එහි ස්වාධීන බලමුලු ගැන්වීමට අවහිර කිරීම සමඟ සම්පාත වෙයි. මෙම පක්ෂ එන්ට එන්ටම කොලඹ දේශපාලන සංස්ථාපිතයටම තුරුලු වෙමින් තිබේ.

අවස්ථාවාදී දේශපාලනයේ මෙම අත්දැකීම් පිලිබඳ ශේෂ පත්‍රයක් සකසා ගැනීම සඳහා කම්කරු හා තරුන ජනතාවට කාලය එලඹ තිබේ. ජනවාරි 26 දින ජනාධිපතිවරනයේ පටන් ඇතිව තිබෙන සිදුවීම්, කම්කරු පන්තියේ ජීවන තත්වයන් මත දුරදිග යන

ප්‍රහාරයක් එල්ලකිරීම සඳහා රාජපක්ෂ තන්ත්‍රය සූදානම් වෙමින් සිටින අතරතුර පවා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහි එහි ප්‍රහාර උත්සන්න කර තිබෙන ආකාරය පෙන්නුම් කරයි. ආරම්භයේදී නාමික ඉලක්කය රාජපක්ෂගේ එදිරිවාදියා වන ජෙනරාල් සරත් ෆොන්සේකා වුවත්, ආන්ඩුවේ ආඥාදායක ක්‍රමෝපායන් වඩ වඩාත් එල්ල කෙරෙන්නේ කම්කරු පන්තියට එරෙහිවය. ෆොන්සේකා ජයගත්තේ නම් ඔහු ක්‍රියාවට නගනු ඇත්තේ ද ඒ හා සමාන විධික්‍රමයි. කම්කරු පන්තිය ධනේශ්වරයට යටත්කිරීම මාරාන්තික බව ඔප්පු කෙරෙන විප්ලවවාදී අරගලයන්ගේ නව කාල පරිච්ඡේදයක් මතුව එමින් තිබේ. කම්කරුවන් හා තරුනයන් නව මඟක් ගත යුතුය. ලංකාවේ හා ජාත්‍යන්තර ඉතිහාසයේ පාඩම් බැරෑරුම්ව අධ්‍යයනය කල යුතුය. මූලධර්මාත්මක මාක්ස්වාදී දේශපාලනයෙන් සන්නද්ධ වෙමින්, දකුනු ආසියාවේ ද ජාත්‍යන්තරව ද සමාජවාදය සඳහා සටන් වැදීමට ජාත්‍යන්තර කමිටුවේ ලංකා ශාඛාව වන සසපට බැඳිය යුතුය.